## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

## ප්‍රසම්පාදන  දැන්වීම

## සිංහල හා දෙමළ යුනිකෝඩ් ෆොන්ට (fonts) මිල දී ගැනීම

## ICTA/GOSL/GOODS/NS/2016/35(A)

විදුලි සංදේශ හා ඩිජිටල් පහසුකම් අමාත්‍යංශය  යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), තවත් පාර්ශවකරුවන් සමග සහයෝගයෙන්  දේශීය භාෂාවලින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සිදු කිරීමේ ගැටලුවලට අවධානය යොමු කර තිබේ.

වැඩිපුර දේශීය භාෂා යුනිකෝඩ් ෆොන්ට ප්‍රචලිත කිරීම සඳහා  ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), සිංහල හා දෙමළ යුනිකෝඩ් ෆොන්ට ගණනාවක් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

සිංහල ෆොන්ට පැහැදිලි හා නිවැරදි මෙන් ම සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන පොයින්ට් ප්‍රමාණවලින් සියලු අක්ෂරවලින් සමන්විත විය යුතුය. සියලු සිංහල ව්‍යංජනාක්ෂර හා ප්‍රාණාක්ෂර මෙන්ම  ව්‍යංජනාක්ෂර හා ප්‍රණාක්ෂරවල සියලුම සංයෝජන ද අඩංගු විය යුතුය. ෆොන්ටවල බැඳි අකුරු 12 හා  ඒවායේ සංයෝජන ද ඇතුළත් විය යුතුය. සිංහල ෆෙන්ට SLS 1134 : 2004 තොරතුරු හුවමාරුව සඳහා වූ සිංහල අක්ෂර කේතය, 2 වැනි කොටස, අවශ්‍යතා හා පරීක්ෂා ක්‍රම යන ප්‍රමිතියේ ෆොන්ට සඳහා 3 වැනි මට්ටමට අනුකූල විය යුතු වේ.

දෙමළ ෆොන්ට SLS 1326 : 2008  තොරතුරු හුවමාරුව සඳහා වූ දෙමළ අක්ෂර කේතයට අනුකූලව සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන  පොයින්ට් ප්‍රමාණවලින් නිවැරදි අංග සහිතව සියලුම අක්ෂරවලින් සමන්විත විය යුතුය. එහි සියලු දෙමළ ව්‍යංජනාක්ෂර හා ප්‍රාණාක්ෂර මෙන්ම  ග්‍රන්ථ අක්ෂරද අඩංගු විය යුතුය. යුනිකෝඩ් ප්‍රමිතියේ සංකේතනය කර ඇති සියලු දෙමළ සංකේත ද ඇතුළත් විය යුතුය. ශ්‍රී සඳහා ඇති සංකේත දෙක ද  (ஸ்ரீ හා ஶ்ரீ ) අඩංගු විය යුතුය.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට මෙම ෆොන්ට විකරණය කිරීමටත් ‘ක්‍රියේටිව් කොමන්ස් ඇට්‍රිබියුෂන්‘ (Creative Commons Attribution) බලපත්‍රයක් යටතේ  රටට ඒවා නොමිලේ ලබා දීමටත් බලය පැවරීමට එකඟ විය යුතුය.  ඉතාම සුදුසු ෆොන්ට ලබා ගැනීමේ තීරණයට පදනම් වන්නේ විශේෂඥ කණ්ඩායමක් විසින් සිදු කරන සමාලෝචනය හා නිර්දේශයි.

මේ පිළිබඳ වැඩි විස්තර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන හා පරිපාලන ප්‍රධානී ගාමිණී කරුණාරත්න මහතාගෙන් ලබා ගත හැකි වේ.  (දුරකථනය +94 11 2369099; ෆැක්ස් +94 11 2369091; ඉ-තැපෑල procurement@icta.lk)

මේ පිළිබඳ ව උනන්දුවක් දක්වන සිංහල හා දෙමළ යුනිකෝඩ් ෆොන්ට අයිතිකරුවන්/ සංවර්ධකයන්ට ඔවුන්ගේ යෝජනා පත්‍ර ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කෙරේ. පහත දැක්වෙන ලිපිනයේ පිහිටි  ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට (ICTA) 2016 සැප්තැම්බර් 14 දින හෝ එයට පෙර යෝජනා පත්‍ර සමග, අදාල  ෆොන්ට, සංයුක්ත තැටියක (CD) දමා ඉදිරිපත් කළ යුතුය. යෝජනාව හා (CD) තැටිය අඩංගු ලියුම් කවරයේ  “සිංහල හා දෙමළ යුනිකෝඩ් ෆොන්ට ප්‍රසම්පාදනය” යනුවෙන් ලකුණු කර තිබිය යුතුය.

කළමනාකාර අධ්‍යක්ෂ<br>
ශ්‍රී ලංකා  තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය<br>
160/24, කිරි මණ්ඩල මාවත<br>
කොළඹ 5

2016 අගෝස්තු මස 31 වැනිදා